

8

# මහධන සිටුපුත්හුගේ වස්තුව

අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, පන්සිය පනස් ජාතක පොත, ධාතු වංසය, සද්ධර්මාලංකාරය, දළදා සිරිත ආදි චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන්ගෙන් සිංහල සාහිත්‍යය පොහොසත් ය. මේ ග්‍රන්ථ රචනා වූයේ දෙසවනින් අසා රස විඳිය හැකි ලෙසිනි. දඹදෙණි අවධියෙහි වැඩ විසූ ධර්මසේන හිමියන් ලියූ සද්ධර්මරත්නාවලියෙහි ඇතුළත් මේ මහධන සිටුපුත්හුගේ වස්තුව ඇතුළු කථාවලින් පිළිබිඹු වන්නේ ගැමි වහර ද ගැමි ජීවිතය ද ඇසුරෙන් සකස් කර ගත් ශ්‍රැතිගෝචර ශෛලියකි.

පැරණි සාහිත්‍ය ග්‍රන්ථ ඊට හිමි ශෛලියෙන් ම කියැවීමෙන් ද කියනු ඇසීමෙන් ද මහත් වින්දනයක් තාක්ෂණික ශිල්ප ක්‍රම දියුණු වූ වර්තමානයේ දී ද ලැබිය හැකි ය.

තව ද කළමනා සුචරිත විෂය තබා ලා නොකළමනා දෙය කරන්නවුනට වන විපත්ති හඟවන්ට මහධන සිටුපුත්හුගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්-

ඒ සිටුපුත් තෙමේ බරණැස අසූ කෙළක් වස්තු ඇති සිටු කුලයෙක උපන. උන්ගේ දෙමවුපියෝ 'අපගේ සම්පත මහත, අපගේ පුතණුවන් කැමති පමණකට ඇත. සෙස්ස හැයි දැ'යි විද්දත් කුලයෙක උපන්නා සේ ගී නැටුම් පමණක් ඉගැන්වූහ. එම නුවර අසූ කෙළක් වස්තු ඇති කුලයෙක දුවණි කෙනකුත් උපන්හ. උන්ගේ දෙමවුපියෝත් අර මුන්ගේ දෙමවුපියන් සිතූ ලෙසට ම සිතා උනුත් ගී නැටුම් පමණක් ඉගැන්වූහ. වැඩි විය පැමිණියවුන් ඔවුනොවුන්ට ම නිල කළහ.

කල් යැමක දී දෙපක්ෂයේ ම දෙමවුපියෝ මළහ. එක්ලක්ෂ සැට කෙළක් පමණ වස්තුව එක ගෙට ම විය. සිටු පුත්‍රයාණෝ ද දවස තුන් විටක් රාජ සේවයට යෙති. ඉක්බිත්තෙන් එ නුවර රා සොඬහු 'ඉදින් මේ සිටු පුත්‍රයාණෝත් රා සොඬහු නම් අපට මහා සැප ය. උනුත් රා සොඬ කරම්හ' යි සිතූහ. එසේ සිතාලා රාත් හැරගෙන බැදි දඩ මස හා ලුණුත් එකුරැත්තේ බැඳගෙන මුල පලා මුලුත් හැරගෙන උන් රජගෙන් එන තෙක් මග බල බලා හිඳලා සිටු පුත්‍රයාණන් එන්නවුන් දැක රා බී පියා ලුණු කට ලා ගෙන මුල පලා මුල් ඩැ ඩැ 'ස්වාමීනි, සිටු පුත්‍රයාණන් වහන්ස, බොහෝ කලක් ජීවත් වුන මැනව. අපි නුඹ වහන්සේට පිනට කන්ට බොන්ට සමර්ථ වූම්හ'යි කිවු ය. සිටු පුත්‍රයාණෝ ද උන්ගේ බස් අසා පස්සේ එන බුලත් කවන්නවුන් අතින් 'තුලුන් බොන්නේ කුමක් දැ' යි විචාරා 'එක් පාන වර්ගයෙකැ'යි කී කල්හි 'යහපත් දෙයක් දැ'යි විචාළෝ ය. 'ස්වාමීනි, මෙලොව මෙයට වඩා පියයුත්තෙක් නැතැ'යි කීය. 'එසේ වී නම් මාත් ඒ බොන්ට වුවමැනවැ'යි මඳක් මඳක් ගෙන්වා ගෙන බොති. ධූර්තයෝ ද සිටු පුත්‍රයාණනුත් රා බොන්ට පටන් ගත් නියාව දැන ගෙන උන් ම පිරිවරා ගත්හ. කල් යත් යත් පිරිවර මහත් විය.

සිටු පුත්‍රයාණෝත් සියයක් යවාලාත්, දෙසියක් යවාලාත් රා ගෙන්වා ගෙන බොන්නෝ කල් යත් යත් හුන් තැන සිටි තැන රන් ගොඩවල් තබ්බවාගෙන රා බොන කල පළඳිනා ලෙසට 'මෙ තෙක් රන් දීලා මල් ගෙනෙව. මෙතෙක් රන් දීලා සුවඳ සාන්දු ගෙනෙව. මූ දූ කෙළියට සුරු වූ ය. මූ නටන්ට සුරු වූ ය. මූ ගී කියන්ට සුරු වූ ය. මූ මද්දල ගසන්ට සුරු වූ ය. මුන්ට දහසක් දෙව. මුන්ට දෙදහසක් දෙව'යි මෙලෙසින් වියදම් කරන සිටුපුත් නොබෝ කලකින් ම තමන් සන්තක අසූ කෙළක් වස්තුව අසත්පථයේ දී නිමවා ඉක්බිත්තෙන් සිටු දුවණියන් සන්තක අසූ කෙළක් වස්තුවත් උන් කිව නො කිව ගෙන්වා ගෙන එයිත් එලෙසින් ම දී නිමවා ජීවත් වන උපදෙස් නැති හෙයින් කෙත් වත් අරම් ආදිය ද, බත් කන රිදී වළන් ආදිය ද, යටත් පිරිසෙයින් හැඳ-කළාල්-කොට්ට-මාවුලා ආදිය දැ'යි තමන් දෙපක්ෂය සන්තක සියල්ලක් ම විකොට කැවු ය. ඒ හැම විකොට කා නිමවාලා මාලු අවස්ථාවෙහි දී හිඳිනා ගෙයත් වික්කහ. ගෙය විකිණීව හැරගත්තවුන් ගෙයින් හින්ද

නො දී නෙරි හෙයින් ඇඹෙණියන් කැඳවා ගෙන අනුන්ගේ බිතක්කනකට පලා ගොසින් රඳා හිඳිනාහු කබල් කෙටි හැර ගෙන සිඟා ඇවිද බොහෝ දෙනා කා අන්තයේ ලූ බත් කන්ට පටන් ගත්හ. තමන් කොට පූ පරිත්‍යාග ලෙසට ම නිකෘෂ්ට ජීවිකා වි ය.

එක් දවසක් වහන්දෑ වළඳන තැනට ගොසින් වළඳා අන්තයෙහි බාල වහන්දෑ පාත්‍රවලින් ගෙනවුත් ලන බත් නොමැළිව ලවා ගන්නවුන් දැක පුරා දී ලූ නියාවට ලබන සැටිය ඉතා ලසු හෙයින් පහළ කරන සිනාවක් මෙන් බුදුහු සිනා පහළ කළ සේක. අනඳ මහතෙරුන් වහන්සේ සිනා පහළ කිරීමට කාරණ විචාළ සේක. බුදුහුත් සිනා පහළ කිරීමට කාරණ වදාරන සේක් අනඳයෙනි, මහධන සිටාණන්ගේ පුතණුවන් දුටුවා ද? තුලූ මෙම නුවර දී තමන් සන්තක අසූ කෙළක් හා සිටු දුවණියන් සන්තක අසූ කෙළක් හා මෙලෝ පරලෝ දෙකින් ම කිසිත් ම ප්‍රයෝජනයක් නැති අකාරිය නිසා වියදම් කොට නසා පියා දැන් සිඟා කා ඇවිදිති. ඉදින් මූ තුමූ පළමු වයස දී වස්තුව නො නසා කෘෂි වණික් ආදි කටයුත්තෙක යෙදූ නම් මෙම නුවර නායක සිටු තනතුරු ලැබෙති. ඉදින් පළමු වයස දී ලොවී සැපත් හැර මහණ වූ නම් රහත්ව ලොවුතුරා සැපත් පුරා ලද්දෝ ය. සිටු දුවණියෝත් නායක සිටු දූ තරමටත් අනාගාමි ඵලයටත් පැමිණෙති.

ඉදින් මේ සිටු පුත් මධ්‍යම වයස දී සම්පත ප්‍රයෝජන වන ලෙස යෙදූ නම් මෙම නුවර දෙවන සිටු තනතුරු ලැබෙති. මධ්‍යම වයස දී මහණ වූ නම් අනාගාමි වෙති. සිටු දුවණියෝ ද දෙවන සිටු තනතුරට හා සෙදැගැමි ඵලයට පැමිණෙති. ඉදින් කෙළවර වයස දී වස්තුව ප්‍රයෝජනවත් ලෙස යෙදූ නම් තුන් වන සිටු තනතුර ලැබෙති. ගිහි ගෙන් නික් ම මහණ වූ නම් සෙදැගැමි වෙති. සිටු දුවණියෝත් තුන්වන සිටු දූ තරමටත් සෝවාන් ඵලයටත් පැමිණෙති. තුන් අවස්ථාව ම වරදවා පී හෙයින් ගිහි සම්පතිනුත් පිරිහුණාහු ය. ශ්‍රාමණ්‍ය ඵලයෙනුත් පිරිහුණාහු ය'යි වදාරා බණ වදාරන සේක් 'නූපන් භෝග උපදවා ගන්ටත් උපන් භෝග රැක ගන්ටත් සමර්ථ අවස්ථාවෙහි තමාගේ ම නොදැන්ම නිසා වස්තුන් නො ලදින් නිෂ්ප්‍රයෝජන වන වස්තුව හැර ගොසින් ශාසනිකව ශීල සංරක්ෂණයත් නො කොට පැන් සිඳීමෙන් කුඩ මස්සන් නැති විල්වල පියාපත් වගුළ කොස්වා ලිහිණියන් මෙන් සිතිවිලි ගනිති. විල පැන් නැත්තා සේ ම හිඳිනා තැනුත් නැත. කුඩ මස්සන් නැත්තා මෙන් සම්පතුත් නැති වෙයි. පියා පත් වගුළ කොස්වා ලිහිණියන්ගේ අහස ගමනක් නැත්තා මෙන් කෘෂි වණික් ආදි සම්භව වන වස්තුත් නැති වෙයි.

තව ද යම් කෙණෙක් ගිහිව සම්පතින් ප්‍රයෝජන විඳිනට නිසිව සිට සම්පත් ලබන්ට නිරවද්‍ය වූ උත්සාහ නො කෙරෙත් නම් ලද සැපත් හැර සසුන් වැද මහණ දම් කොට මහණ දමින් ලැබිය යුත්ත නො ලැබෙත් නම් 'පෙර සුව සේ කැම්හ. පූම්හ. සම්පත් වුනුම්හ' යනාදිය සිත සිතා හිඳිත් නම් විද පූ හී දඬු අවු ළන්නන් නැතිව දිරන්නා සේ තුන් වයස ම කළ මනා දෙය නො කොට ඉක්මවා පූ නම් මරණින් මැකෙති. උන් ලද අත් බැව් නිෂ්ඵල ය'යි වදාළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන සෝවාන් - සෙදගැමි - අනගැමි - රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පළමු වයස වරදවා පී වත් මධ්‍යම වයස දී හෝ මධ්‍යම වයසත් වැරැද්දේ නම් කෙළවර වයස දී හෝ පිහිටන තමාට කට යුතු ය. ගිහිව පිහිටක් කට නො හැකි වී නම් ශාසනිකවත් ලද මනා ගුණ විශේෂ ලබන්ට උත්සාහ කටයුතු.



# ස්වභාවෝක්ති හා අතිශයෝක්ති

## ස්වභාවෝක්ති

යමක් ඇති සැටියෙන් දැක්වීම ස්වභාවෝක්තිය යි.

පහන් වූ කල්හි මද්‍රි දේවි මළුව හැමඳැ දැහැටි පැන් තබා පන්සල් හැමඳැ මල් පුදා දරුවන් දෙදෙනා කැඳවා මුහුණ තබා සිඹැ පියා 'දරුවෙනි, මා රෑ දුටු ස්වප්නය නපුරු. තල බිජුවක් සා යහපතෙක් නැත. තොප පියාණන් ඇලයෙන් බැහැරව නො යව. කෙළනා තැන බියපත් වව'යි දරුවන්ට ඔවා දී..."

**බුත්සරණ (වෙස්සන්තර ජාතකය)**

වන විල් වැදැ බොල් සෙවලැ'ගැ තවරා
ගන වල් කැල ඇර ගෙන අති නුඳුරා
දිගු උල් සිඟු යොමු කැරැ කර අඹරා
පිළිමල් වන මීවුන් දකු නුඳුරා

**ගිරා සන්දේශය**

සිය දරු දෙදෙනාට කරදරයක් වෙතැයි බිය පත් වන මවකගේ ස්වභාවයත් වනගත මී ගවයන්ගේ චණ්ඩ ස්වභාවයත් පවත්නා ආකාරයෙන් ම ඉහත උද්ධෘත මගින් දැක්වෙයි.

# අතිශයෝක්ති

ඇති තතු ඉක්මවා දැක්වීම අතිශයෝක්තිය යි.

"එකෙණෙහි මුහුදු දිය කඳ දවා ගෙන වඩවා මුඛයෙන් පිටත් වැ ගිය අවීචියෙහි ගිනි කඳක් සේ රළු මතැත් තෙම සොඬ හකුළුවා මහ පොළොව යදඬෙකින් ගැසූ ඝණ්ටාවක් සේ අනුරාව දෙවමින් ගිගුරු හඬින් මුළු නුවර අසනිපාතයක් සේ තතුණුවමින්..."

**බුත්සරණ (නාලාගිරි දමනය)**

මෙනිරිඳු විකුමෙන් සිතුවොත් වැරසැර
මහමෙර තුඹසෙකි කිඳලෙකි සමුදුර
සියදොර වැලි මළුවෙකි දඹදිව තර
සෙසුරජ නර පණුවන් කිම බැඳ වෙර

**පැරකුම්බා සිරිත**

ඇත්හලින් මුදා හළ නාලාගිරි ඇතු වියරුවෙන් දිව එන ආකාරයත් පැරකුම්බා රජුගේ වික්‍රමවත් ස්වභාවයත් ඉහත උද්ධෘත මගින් පවත්නා තත්ත්වය ඉක්මවා වර්ණනා කොට ඇත.

**අරුත් පැහැදිලි කිරීම**

| | |
|---|---|
| සෙස්ස හැයි දැයි | - අනික් දේ කුමකට දැයි |
| නිල කළභ | - නියම කළභ |
| කෙළක් | - කෝටියක් |
| රා සොඬහු | - රා බීමෙහි ලොල් වූවෝ/බේබද්දෝ |
| එකුරුත්තේ | - ඔඩොක්කුවේ |
| මුල පලා | - රාබු |
| ඩැ ඩැ | - අල්ලා ගනිමින් |
| පිය යුත්තෙක් | - බීමට සුදුසු දෙයක් |
| ධූර්තයෝ | - (මත් පැන්) ලෝලීහු |

| | |
|---|---|
| සුවඳ සාන්දු | - සුවඳ සඳුන් |
| අසත්පථයේ | - අයහපත්/වැරදි මාර්ගයෙහි |
| හැඳ කළාල් | - ඇඳ ඇතිරිලි |
| කොට්ට මාවුලා | - කොට්ට මෙට්ට |
| විකොට | - විකුණා |
| කබල් කෙටි | - (හිඟමන් යෑමේ දී ගෙන යන) වළන් කැබලි |
| බිතක්කනකට | - පිළිකන්නට/අඟුවට |
| නිකෘෂ්ට ජීවිකා | - පහත් ජීවිකාවන් |
| ලසු | - කුඩා |
| අකාරිය නිසා | - අකටයුත්ත හේතුවෙන් |
| භෝග | - සම්පත් |
| කෘෂි වණික් | - ගොවිතැන් හා වෙළඳාම් |
| බොල් | - රොඩු |
| සිඟු | - අං |
| යදඬෙකින් | - යකඩ දණ්ඩකින් |
| අසනිපාතයක් | - හෙණ ගැසීමක් |
| කිඳලෙකි | - කුඩා දිය වළකි |

## අවබෝධය

1. **සිටු පුත්‍රයාට හා සිටු දියණියන්ට ගී නැටුම් පමණක් ඉගැන්වීමට දෙමාපියන් සිතුවේ කුමක් නිසා ද?**
2. **සිටු පුත්‍රයා සුරාවට ඇබ්බැහි කිරීමට සුරා සොඬුන් යෙදූ උපක්‍රමය කුමක් ද?**
3. **සිටු පුත්‍රයා සන්තක සියලු ධනය වියදම් වූ අයුරු දක්වන්න.**
4. **පළමු, දෙවන හා කෙළවර වයසේ දී බුද්ධිමත්ව ක්‍රියා කළේ නම් ඔවුන් ලබන ගිහි හා පැවිදි සුවය පිළිවෙළින් දක්වන්න.**
5. **පහත සඳහන් වචන සඳහා සමානාර්ථවත් පද පාඩමෙන් උපුටා දක්වන්න.**

| | |
|---|---|
| i. විශාල - | ii. හුරු වූහ - |
| iii. වැරදි මාර්ගයේ- | iv. අවසන් කොට - |
| v. අයිති- | vi. පහන් - |
| vii. කුඩා - | viii. නොකටයුත්ත - |
| ix. සකෘදාගාමී - | x. අනාගාමී - |



# අකාරාදි පිළිවෙළ හා ශබ්දකෝෂ භාවිතය

ඕනෑ ම භාෂාවක පදනම අක්ෂර මාලාව යි. එහි මුල සිට අග දක්වා අනුපිළිවෙළක් ඇත. සිංහල අක්ෂර මාලාවේ මුල් අකුර (අ) වේ. අවසාන අක්ෂරය (ෆ) වේ. ඒ අනුව (අ) යන්නේ සිට (ෆ) යන්න දක්වා අක්ෂර ස්ථාන ගත වී ඇති අනුපිළිවෙළ හැඳින්වෙන්නේ අකාරාදි පිළිවෙළ නමිනි. අකාරාදි පිළිවෙළ ප්‍රායෝගිකව භාවිත වන අවස්ථා බොහෝ ය.

- ශබ්දකෝෂවල හා විශ්වකෝෂවල වචන පෙළ ගැස්වීම
- පුස්තකාලයවල ග්‍රන්ථ නාමාවලි සැකසීම
- දූරකථන නාමාවලි සකස් කිරීම
- ඡන්ද ලැයිස්තු නාමාවලි සකස් කිරීම
- ප්‍රශ්න පත්‍රවල අනුකොටස් දැක්වීම
- විවිධ ලේඛනවල සංඛ්‍යා නියෝජනය වන සේ අකුරු යෙදීම

වචන සමූහයක අකාරාදි පිළිවෙළ තේරීමේ දී හෝ වචන පෙළ ගැස්වීමේ දී කළ යුත්තේ එම වචන සමූහය සිංහල හෝඩියේ අනුපිළිවෙළට ගොනු කොට දැක්වීම යි.

පහත දැක්වෙන නම් කිහිපය දෙස බලන්න.

කසුන්, උපේක්ෂා, අමීනා, ගයාන්, සමීර, ඉරේෂා, ඇන්, රමේෂ්, චමුදි, මදුසර

මේ නම් ඇත්තේ අපිළිවෙළට ය. අකාරාදි පිළිවෙළ අනුව සකස් කළ විට නිවැරදි අනුපිළිවෙළ මෙසේ ය.

| | |
|---|---|
| 1. අමීනා | 6. ගයාන් |
| 2. ඇන් | 7. චමුදි |
| 3. ඉරේෂා | 8. මදුසර |
| 4. උපේක්ෂා | 9. රමේෂ් |
| 5. කසුන් | 10. සමීර |

වචනවල මුල්'කුර සමාන නම් ඒවායෙහි යෙදී ඇති පිලි අනුපිළිවෙළ ද, යෙදී ඇති පිලි ද සමාන නම් ඊළඟ අකුර ද වශයෙන් සැලකිය යුතු ය.

**කරුඹුන්.** දෙබල් වූ. **Furcate.**

**කරු මුල.** (උද්) කඳ කෙළින් තබා ගැනීමට සහාය වෙමින් කඳෙන් සෑදුණු මුලක්. **Prop root.**

**කරූ.** (භූ) රට තුළ තිබෙන සානුවක්: දකුණු අප්‍රිකාවේ තිබෙන ප'මීය හා ත්‍රියාසික ස්තර. **Karoo.**

**කරෝටික.** (සත්ත්ව) ශීර්ෂපෝෂී: ස්වාපක. **Carotid.**


**කර්කටක නිවර්තනය.** (නක්) $23\frac{1}{2}°$ක් වූ උත්තර අක්ෂාංශය: මධ්‍යාහ්නයේ දී ඉර හරියට ම හිස මුදුනේ යැ යි පෙනෙන උතුරුතම රේඛාව. **Tropic of cancer.**

**කර්ණකෝෂ්ඨකය.** (සත්ත්ව) තුලාකෝෂ්ඨය: පෘෂ්ඨවංශීන් ගේ ඇතුළු කනේ කොටසක්: නොයෙකුත් ජලජ අපෘෂ්ඨවංශීන් ගේ සංවේදී කෙඳි ඇතුරුණු ද්‍රවයක් පිරුණු, චූර්ණමය ගල් කැටයක් තිබෙන කෝෂයක්. **Otocyst.**

**කර්ණපටහය.** (සත්ත්ව) පටහය: පෘෂ්ඨවංශීන් ගේ මැද කනේ තිබෙන කම්පනය වන සිවිය: කන් බෙරය. **Tympanum.** කන බ.

**කර්ණමූල ග්‍රන්ථිය.** (සත්ත්ව) පැරොටිඩ් ග්‍රන්ථිය:පරාශ්‍රෝත ග්‍රන්ථිය. **Parotid gland.**

**කර්ණය.** (ගණිත) සෘජු කෝණික ත්‍රිකෝණයක සෘජු කෝණය ඉදිරිපිට තිබෙන පාදය. **Hypotenuse.** (සත්ත්ව) කන. **Ear.**




1. කර්ණය

**කර්ණශංඛය.** (සත්ත්ව) රේවටය: යාන්ත්‍ර තරංග ස්නායු ආවේග බවට පරිවර්තනය කරන මැද කනේ තිබෙන දහර අවයවය. **Cochlea.** කන බ.

**කර්ණ ස්තම්භිකාව.** (සත්ත්ව) කර්ණ පටහය ඇතුළු කනට සම්බන්ධ කරමින්, ධ්වනිය සම්ප්‍රේෂණය කරන ඇට හෝ කාටිලේජ හෝ දණ්ඩ. **Columella auris.**

**කර්ණාකාර.** (උද්) සකර්ණික බ. **Auricular.**

**කර්ණාලින්දය.** (සත්ත්ව) ඇතුළු කන් කුහරය. **Vestibule.**

**කර්ණාශ්මය.** (සත්ත්ව) කර්ණකෝෂ්ඨකයේ තිබෙන චූර්ණමය ගල් කැටය. **Otolith.**

**කර්ණික.** කන් පෙත්ත වැනි. **Auricular.**

**කර්ණිකාව.** (උද්) පත්‍රයක හෝ උනෙක් අවයවයක හෝ පාදයෙහි තිබෙන කනක් වැනි අවයවය. (සත්ත්ව) හෘත්අලින්දය: හෘදයේ කාමරයක්. **Auricle.**

**කර්තනාංගය.** (සත්ත්ව) මකුළුවා දැල කටින සිදුරු කීපයක් සහිත අවයවයක්. **Spinneret.**

**කර්තරී.** කතිරයක් වැනි. **Cruciate.**

**කර්තෘ භාගය.** (ආර්) පුරස්කාරය: ප්‍රකාශකයා කර්තෘට කරන ගෙවීම. **Royalty.**

**කර්නිග් ලක්ෂණ.** (වෛ) මස්තිෂ්ක පටල ප්‍රදාහයේ ලක්ෂණයක්: කළව ශරීරයට සෘජු කෝණික වන සේ උඩුබැලියෙන් දිගා වූ විට දණ දිගහරින්නට බැරිකම. **Kernig's sign.**

**කර්පන්ටයින්.** (කෘෂි) ටර්පන්ටයින්. **Terpentine.**

**කර්පරය.** (සත්ත්ව) හිස බ. **Cephalus.**

**කර්පරික.** (වෛ) හිසෙහි තිබෙන: හිස පිළිබඳ වූ. **Cephalic.**

**කර්පූර.** (රසා) කපුරු බ. **Camphor.**

**කර්මාන්තය.** (ආර්) ශිල්පය: නිෂ්පාදනය. **Industry.**

**කර්ෂණය.** (භෞ) ප්‍රකර්ෂණය: ඇදගෙන යෑම. ඇදගෙන යෑම පිටුපස තිබෙන ගාමක බලය: **Traction.**

**කලංකය.** (උද්) පරාග ප්‍රරෝහණය වීම පිණිස කීලයේ අග තිබෙන මහත් වූ කොටස. **Stigma.** (වෛ) තුවාලයක් සුව වූ පසු තිබෙන කැලල: අවයවයක් කලින් හා වී තිබුණු තැන ඇති ලපය. **Cicatrix.**

**කලකන්දය.** (උද්) අලවිය: අලයක් වැනි කඳක්: කෙටි, මහත, සිරස් අතට තිබෙන රෛසෝමයක්. **Root stock.**

**කලත්‍රයා.** ස්වාමිපුරුෂයා හෝ භාර්යාව. **Spouse.**

**කලනය.** (ගණිත) විචල්‍ය රාශි හා ඒවායේ වෙනස් වීමේ සීඝ්‍රතා පිළිබඳ වූ ගණිත ක්‍රමයක්. **Calculus.** අවකලනයත් අනුකලනයත් බ.

**කලන්ද.** (සත්ත්ව) කුඩා මුහුදු මාළුවෙක්. **Whiting.**

**කලපාසය.** (භෞ) කැලිපරය බ. **Callipers.**

**කලපුව.** (භූ) පටු තිඹ තීරයක් නිසා සම්පූර්ණයෙන් ම හෝ අඩ වශයෙන් හෝ මුහුදින් වෙන් වූ නොගැඹුරු ජලාශය. **Lagoon.**

**කලඹ.** කලාපය: කදම්බය: පොකුර. **Bundle.**

**කලබලය.** (නීති) අවුල: කැරැල්ල. **Commotion**

**කලම.** (සත්ත්ව) පිහාටුවක නාරටියේ අවිදූර කුහර කොටස. **Calamus.**

**කලම්ප මඟ.** (උද්) ඇතැම් දිලීර සූත්‍රිකාවල ආවාරයේ දෙ පැත්ත සම්බන්ධ කෙරෙමින් පවතින, ආපස්සට නැමුණු, කෙටි, සූත්‍රිකාවක්. **Clamp connection.**

**කලම්පය.** උපකරණ කොටස් එකට අල්ලා

## ලිඛිත අභ්‍යාස

1. **පාඩමේ දැක්වෙන ශබ්දකෝෂ පිටුවේ එන පහත දැක්වෙන වචන අනුපිළිවෙළට සකස් කරන්න.**

    කලබ, කලත්‍රයා, කර්ණය, කර්මාන්තය, කලනය, කර්තෘභාගය, කලපුව, කර්ණිකාව

2. **පහත දැක්වෙන ග්‍රන්ථ නාම අකාරාදි පිළිවෙළට සකසන්න.**
    බුත්සරණ, පූජාවලිය, අමාවතුර, සද්ධර්මරත්නාවලිය

## ප්‍රායෝගික අභ්‍යාස

1. **අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය ආදි විවිධ ශෛලියෙන් රචිත පොත්වලින් කොටස් කිහිපයක් තෝරා ගෙන කියවීමේ තරගයක් පවත්වන්න.**

2. **අතිශයෝක්තියට හා ස්වභාවෝක්තියට නිදසුන් කළ හැකි සාහිත්‍ය නිර්මාණ උද්ධෘත දෙක බැගින් තෝරා ගෙන බිත්ති පුවත්පතේ පළ කරන්න.**

3. **ඔබගේ පන්තියේ සිසු/සිසුවියන්ගේ නම් ලැයිස්තුව අකාරාදි අනුපිළිවෙළට ලියූ පසු මුලට හා අගට යෙදෙන නම් මොනවා දැයි බලන්න.**